*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

# නර්තනය

**6 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ආධුනික නර්තන ශිල්පියෙකු නර්තනය ආරම්භ කිරීමට පෙර කරනු ලබන නමස්කාර සරඹයේ ''දොහොත් නළලට තබා වැඳීම ''

(1) පළමු වැඳුම වේ (2) තෙවන වැඳුම වේ
(3) හතරවන වැඳුම වේ (4) දෙවන වැඳුම වේ

02 පා සරඹ නර්තනය කිරීමේ දී වාදනය සඳහා භාවිත කරනු ලබන්නේ,

(1) තාලම්පට පමණි (2) උඩැක්කිය පමණි
(3) ගැටබෙරය පමණි (4) පන්තේරුව පමණි

03 ''තත් ජිත් තොං නං තා'' යනු

(1) තෙවන ගොඩ සරඹයේ කස්තිරම වේ (2) පළමුවන ගොඩ සරඹයේ කස්තිරම වේ
(3) දෙවන ගොඩ සරඹයේ කස්තිරම වේ (4) හතරවන ගොඩ සරඹයේ කස්තිරම වේ

04 දරු සෙනෙහස හා දරුවන් සනසාලීමට ගායනා කළ කවි විශේෂය වනුයේ,

(1) තෙරුවන් ගුණ ගායනයයි (2) කළගෙඩි කවි ගායනයයි
(3) නැළවිලි කවි ගායනයයි (4) ලී කෙළි කවි ගායනයයි

05 ''තෛ'' මාසය නමින් හඳුන්වන්නේ අවුරුද්දේ කුමන මාසය ද?

(1) ජනවාරි මාසය (2) මාර්තු මාසය
(3) මැයි මාසය (4) පෙබරවාරි මාසය

- **පහත සඳහන් වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

06 දේශීය නර්තන සම්ප්‍රදායන් තුනේම ''නමස්කාරය'' යන පදය භාවිත කරනු ලැබේ. ( )

07 ''අඩිය'' යනු දෙවන පා සරඹයේ සරඹ නාමය වේ. ( )

08 ''අහසට පිඹිනා එරන් කළේයා'' මෙය කළගෙඩි කවියකි. ( )

09 ද්‍රවිඩ ජනයාගේ විශේෂ දිනයක් ලෙස තෛපොංගල් දිනය හැඳින්විය හැකිය. ( )

10 නර්තන ශිල්පියෙකුගේ මැණ්ඩිය අතර දුර ප්‍රමාණය මිටිරියන් දෙකකි. ( )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළ දී ඇති පිළිතුරුවලින් තෝරා ලියන්න.**
  (සිංහරාජ, ලී කෙළි, ආචාර කිරීම, කටින් පද කියා, කෝලම් රටා)

11 තෛපොංගල් උත්සවයේ දී ඇඳිනු ලබන අලංකාර සිතුවමකි ..........................................................

12 පා සරඹ නැටීමේ දී ................................................ නැටීම එහි සුවිශේෂී ලක්ෂණයකි.

13 ශ්‍රී ලංකාවේ විශාල වනාන්තරයකි ....................................................

14 .......................................................... ගැමි නැටුමකි.

15 නමස්කාරය යන වචනය සමාජය තුළ අර්ථ ගැන්වෙන අවස්ථාවකි ..................................................

- **A කොටසේ පිළිතුරට ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | **A** - කොටස | | **B** - කොටස |
|---|---|---|---|
| 16 | වනගතේ පිපි මල් දෙකක් මෙන් | 1. | ස්ථිතික චලන |
| 17 | සරළ බව සහ සාමූහික බව | 2. | ගුරුවන්දනා ගායනා |
| 18 | මුහුදේ රැළි නංවමින් වෙරළ කරා ගමන් කිරීම | 3. | ලී කෙළි කවි |
| 19 | බෝ අත්තට වැද සිරස නමන්නේ | 4. | රිද්මයානුකූල චලන |
| 20 | එක තුන උඩ පැනීම | 5. | ගැමි නැටුම් |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) සංචාරි චලනවලට උදාහරණයක් ලියන්න.
   (ii) උඩරට නර්තනයේ මූලික අංගහාරය කුමක්ද?
   (iii) දෙවන පා සරඹය ලියන්න.
   (iv) ස්ථිතික චලනවලට උදාහරණයක් ලියන්න.
   (v) ගොඩ සරඹවලට කියන තවත් නමක් ලියන්න. (ලකුණු 10 යි.)

02 (i) ගුරු ගෙදර අධ්‍යාපනය හා සබැඳි චාරිත්‍ර දෙකක් හා සාර ධර්ම දෙකක් ලියන්න. (ලකුණු 05 යි.)
   (ii) ගුරු ගෙදර දී ගුරුන් ඇසුරින් ආධුනික ශිල්පියා ලබා ගන්නා අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 05 යි.)

03 (i) මැණ්ඩියේ මූලික ලක්ෂණ දෙකක් ලියන්න.
   (ii) පළමු පා සරඹයේ සරඹ නාමය හා සරඹය ලියන්න. (ලකුණු 10 යි.)

04 (i) නමස්කාර සරඹය ලියන්න. (ලකුණු 05 යි.)
   (ii) නමස්කාරයේ දෙවන වැඳීම සිදු කරන ආකාරය ලියා එහි තේරුම ලියන්න. (ලකුණු 05 යි.)

05 (i) ගස්වැල්වලින් මිනිසා ලබන ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 05 යි.)
   (ii) පරිසරය තුළ අපට ඇසෙන විවිධ ශබ්ද හා නාද හතරක් ලියන්න. (ලකුණු 05 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 06 | ✓ | 11 | කෝලම් රටා | 16 | ගුරුවන්දනා ගායනා | | |
| 02 | 1 | 07 | x | 12 | කවින් පද කියා | 17 | ගැමි නැටුම් | | |
| 03 | 2 | 08 | ✓ | 13 | සිංහරාජ | 18 | රිද්මයානුකූල චලන | | |
| 04 | 3 | 09 | ✓ | 14 | ලී කෙළි | 19 | ලී කෙළි කවි | | |
| 05 | 1 | 10 | x | 15 | ආචාර කිරීම | 20 | ස්ථිතික චලන | (1 x 20 = 20) | |

## II කොටස

01 (i) නිදහසේ ඇවිදීම, නිදහසේ පනිමින් යාම, දිවීම, පෙරළීම, බඩගෑම, රිංගීම

(ii) මැණ්ඩිය

(iii) තෙයි කිට තෙයි තාම්

(iv) එකතැන උඩ පැනීම, එකතැන දිවීම, ඉන කරකැවීම, ශරීරය හැකිලීම, සිටගැනීම, වාඩිවීම

(v) අත් සරඹ (ලකුණු 05 යි.)

02 (i) චාරිත්‍ර : දෙමව්පියන් සමග ගොස් බුලත් දී වැඳීම
ගුරුන්ට දරුවා බාරදීම , ගුරු නමස්කාරය
දණ්ඩිකඳට නමස්කාර කිරීම
වාද්‍ය භාණ්ඩ සහ වස්ත්‍රාභරණවලට ගරු කිරීම

සාරධර්ම : ආගමට මුල්තැන දීම, වැඩිහිටියන්ට ගරු කිරීම ආදී වශයෙන් (ලකුණු 05 යි.)

(ii) සැරසිලි වර්ග හඳුනාගැනීම සහ සැරසිලි නිර්මාණය කිරීමේ හැකියාව ලබයි.
වාද්‍යභාණ්ඩ හඳුනාගැනීම සහ වාදනය කිරීමේ හැකියාව ලබයි. (ලකුණු 05 යි.)

03 (i) මැණ්ඩිය සඳහා විලුම්දෙක අතර පරතරය මීටරියනක් වීම.
පාදවල ඇඟිලි සහ දණහිස් දෙක දෙපසට විහිදීම සුවිශේෂී වීම.
මුළු සිරුරම සෘජුව තබා ගැනීම වැදගත් වීම. (ලකුණු 05 යි.)

(ii) සරඹ නාමය : අඩිය
සරඹය : තෙයි (ලකුණු 05 යි.)

04 (i) තෙයියත් තෙයියත් තෙයියත් තාම්
තෙයියත් තෙයියත් තෙයියත් තාම්
තෙයියත් තෙයියත් තෙයියත් තාම්
තෙයියත් තෙයියත් තෙයියත් තාම් (ලකුණු 05 යි.)

(ii) දොහොත් නළලත තබා වැඳීම
තේරුම : මම හදවතින්ම දෙවියන් වඳිමි. මම සියලු දෙවියන්ගේ පිහිට පතමි. (ලකුණු 05 යි.)

05 (i) ආහාර සපයා ගැනීම
ආයුර්වේද බෙහෙත් සපයා ගැනීම
දැව අවශ්‍යතා සපයා ගැනීම
වළාකුළු මගින් වර්ෂාව ලබා ගැනීම. (ලකුණු 05 යි.)

(ii) ජලය ගලා බසින ශබ්දය
වැසි අවස්ථාවක ඇතිවන ශබ්දය හා නාදය
විවිධ සතුන්ගේ ශබ්ද හා නාද
කර්මාන්ත, වාහනවලින් ඇතිවන ශබ්ද හා නාද
සුළඟ නිසා ගස්වැල් එකට ගැටීමෙන් හා ඇඹරීමෙන් ඇතිවන ශබ්ද (ලකුණු 05 යි.)

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අනාවරණ පරීක්ෂණය 2021

6 ශ්‍රේණිය

# නර්තනය

---

### ප්‍රායෝගික පරීක්ෂණය

| | | |
|---|---|---|
| 01 | කැමති ගායනයක් කිරීම. | (ලකුණු 10 යි.) |
| 02 | පළමුවන පාසරඹය නර්තනය කර හමාර පදය නර්තනය කිරීම. | (ලකුණු 10 යි.) |
| 03 | පළමුවන ගොඩසරඹය නර්තනය කිරීම. | (ලකුණු 10 යි.) |
| 04 | කළගෙඩි හෝ ලීකෙලි කවියකට නර්තනයක් ඉදිරිපත් කිරීම. | (ලකුණු 10 යි.) |
| 05 | සත්ව චරිතයක් නිරූපණය කිරීම. (ඉබ්බා , හාවා , අලියා , අශ්වයා) | (ලකුණු 10 යි.) |
| | | ( මුළු ලකුණු 50) |